**බලපිටිය ප්‍රාදේශීය සභාව**
**ගාල්ල දිස්ත්‍රික්කය**
**------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන
**------------------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
------------------------------------

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 16 දින ද, විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 ජුනි 30 දින ද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය
---------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට බලපිටිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
-----------------------------------------------

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
**----------------------------**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයට ගෙවියයුතු රු.7,439,652 ක්වූ විශ්‍රාම වැටුප් දායක මුදල් වෙනුවෙන් ප්‍රතිපාදනයන් සලසා නොතිබුණි. | අවශ්‍ය ප්‍රතිපාදනයන් සලසා ගත යුතුවේ. | 2020 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ආ) | ඉකුත් වර්ෂ වෙනුවෙන් ගෙවන ලද විගණන ගාස්තු රු.355,980 ක් සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබූ අතර, සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණන ගාස්තු වෙනුවෙන් ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි. | ණයහිමි ප්‍රතිපාදනයන් ඇති කල යුතුවේ. | 2020 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | ඉකුත් වර්ෂයේ මුද්දර ගාස්තු ලැබීම් රු.5,000,000 ක් පොදු තැන්පත් ගිණුමට බැර කිරීමේ වරද නිවැරදි කර නොතිබුණි. | ලැබීම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

### 1.3.2 නොසැසඳුනු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 09 කට අදාළ ශේෂයන් හා ඒවාට අදාළ උපයෝගී ලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු.38,171,682 ක වෙනසක් පැවතුණි. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | කාලයක සිට පවතින අසමාන -තාවයන් බැවින් ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

### 1.4 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ යනාදියට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- | --- |
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | | | |
| | (i) 149 වන වගන්තිය | සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි වී ඇති ආයතනවලින් සියයට එක දක්වා බද්දක් අයකර ගැනීමට සභාවේ අවධානය යොමු වී නොතිබුණි. | ලැබිය යුතු සම්පූර්ණ ආදායම අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | නිවැරදිව අයකර ගැනීමට කටයුතු කරමි. |
| | (ii) 182 වන වගන්තිය | විෂය භාර අමාත්‍යවරයාගේ හා සභාවේ අනුමැතියකින් තොරව 2013 වර්ෂයේ සිට පැවත එන හිඟහිටි බලපත්‍ර ගාස්තු රු.181,030 ක් කපාහැර තිබුණි. | ආදායම් කපාහැරීම සඳහා අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමෙන් පසුව කපාහැරීම කළ යුතුවේ. | 2020 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | **1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන ) රීති** | | | |
| (i) | රීති 33 | වරිපනම් බදු ගෙවීම පැහැර හැර ඇති පුද්ගලයින් පිළිබඳ ලැයිස්තු හා දේපල තහනම් කිරීමේ වරෙන්තු ලැයිස්තු පිළියෙල කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී වරෙන්තු නිකුත් කර, හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කරමි. |
| (ii) | රීති 218 | සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි වර්ෂයකට වරක් හෝ පරීක්‍ෂා කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී නිසි පරිදි කටයුතු කරමි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 | වසර 02ක ඉක්ම වූ රු.6,034,816 ක් වටිනා තැන්පතු සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම් රු.29,827,894 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.45,365,855 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 15,449,000 | 13,022,778 | 14,439,340 | 17,007,896 | 8,130,000 | 6,988,267 | 5,003,370 | 15,106,612 |
| කුලී | 2,950,000 | 265,125 | 331,475 | 351,833 | 2,650,000 | 144,700 | 963,025 | 369,164 |
| බලපත්‍ර ගාස්තු | 4,705,000 | 9,927,433 | 9,926,433 | 1000 | 5,581,000 | 5,530,761 | 5,540,011 | 181,030 |
| වෙනත් ආදායම් | 85,335,000 | 27,100,000 | 19,576,880 | 65,158,369 | 117,455,000 | 56,565,652 | 31,528,075 | 140,400,601 |
| | 108,439,000 | 50,315,336 | 44,274,128 | 82,519,098 | 133,816,000 | 69,229,380 | 40,034,481 | 156,057,407 |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| **(අ) සේවක පුරප්පාඩු හා අතිරික්තතා** | | |
| අනුමත තනතුරුවල පැවති පුරප්පාඩු 11 ක් පිරවීම සඳහා කටයුතු කර නොතිබුණු අතර, අතිරික්ත සේවකයින් 17 ගේ තනතුරු විධිමත් කර ගැනීමට පියවර ගෙන නොතිබුණි. | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට හා අතිරික්ත තනතුරු විධිමත් කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | තනතුරු විධිමත් කර ගැනීමට කටයුතු කරමි. |
| **(ආ) සේවක ණය** | | |
| සේවකයින් 08 දෙනෙකුගේ සේවක ණය රු.185,803 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | මු.රෙ. 71 යටතේ ඉදිරියේ දී අයකර ගැනීමට කටයුතු කරමි. |

**3.2 කාර්යසාධනය**

| | | |
| --- | --- | --- |
| (අ) ව්‍යාපෘති ආරම්භ කිරීමේ දුර්වලතා | | |
| 2019 පළාත් සභා මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ ලැබුණු රු.450,000 ක් වූ කර්මාන්ත දෙකක් 2019 දෙසැම්බර් 31 දින වන විට ද ආරම්භ කර නොතිබුණි. | ව්‍යාපෘති ආරම්භ කිරීමට කටයුතු කළ යුතුවේ. | ව්‍යාපෘති ආරම්භ කිරීමට කටයුතු කරමි. |
| (ආ) ව්‍යාපෘති ආරම්භ නොකිරීම | | |
| උපමාන පාදක ප්‍රදාන යටතේ වතුගෙදර තොටවත්ත ආදාහනාගාරය සංවර්ධනය කිරීමට රු.2,000,000 ක ප්‍රතිපාදන අනුමතව තිබුණද, එම කර්මාන්තය 2019 දෙසැම්බර් 31 දින වන විටත් ආරම්භ කර නොතිබුණි. | ව්‍යාපෘතිය ආරම්භ කිරීමට කටයුතු කළ යුතුවේ. | ව්‍යාපෘතිය ආරම්භ කිරීමට කටයුතු කරමි. |

(ඇ) ව්‍යාපෘති කාර්යයසාධනය

-------------------------------

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනයෙන් බලප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් ඉටුකිරීමට යෝජිත රු.35,064,000 ක් වටිනා ව්‍යාපෘති 43 කින් සමාලෝචිත වර්ෂය තුළ ආරම්භ කර තිබුණේ ව්‍යාපෘති 09 ක් පමණි. | ඉටුකර ගැනීමට ඇති හැකියාව පිළිබඳව සලකා බලා අයවැය යෝජනා ඉදිරිපත් කළ යුතුවේ. | අයවැයගත ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රතිශතය ඉහල නංවා ගැනීමට කටයුතු කරමි. |